"හාම්පුතා" යන යෙදුම අතීතයේ සිට සිංහල භාෂාව තුළ භාවිතා වූ අතර, වර්තමානයේද ඇතැම් විට යෙදෙනු දක්නට ලැබේ. පහත පුවත් වාර්තාවන් ඊට උදාහරණ වේ.

කෙසේ නමුත්,

"හාම්පුතා" යන යෙදුම ඔස්සේ වඩාත් පසුගාමී ස්වාමි-සේවක සම්බන්ධතාවයක් නොහැඟවෙන්නේද?

අතීතයේ පැවති ස්වාමි-සේවක සම්බන්ධතාවය වර්තමානය වන විට වඩාත් වෘත්තිය මුහුණුවරක පවතින සේවා නියුක්ත - සේව්‍ය සම්බන්ධතාවයක් දක්වා පරිණාමය වී ඇතැයි ඔබ නොසිතන්නේද?

එසේ බලන විට, එම සේවානියුක්ත-සේව්‍ය සම්බන්ධතාවය තුළට "හාම්පුතා" යන යෙදුම ගැලපෙන්නේ යැයි ඔබ සිතන්නේද?

මෙම පුවත සඳහා "හාම්පුතා" යන යෙදුම වෙනුවට, පුවත් අන්තර්ගතයේ සඳහන් වන "ආයතන හිමියා" වැනි යෙදුමක් ඔබ සිතන ලෙසට වඩාත් නොගැලපෙන්නේද?

**#MediaEthicsSL #lka #sinhalanews #Lankadeepa #Aruna #Divaina**